# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2344/14 – 2023 අගෝස්තු මස 07 වැනි සඳුදා – 2023.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/E/2014/84.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.10.13 දිනැති හා අංක 2197/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.10.07 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රත්මලාන, අත්තිඩිය පාර, අංක 105/14 හි පිහිටි ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී සංගමය (සේවකයින් 50 දෙනා වෙනුවෙන්) සහ රත්මලාන, ගාලු පාර හි පිහිටි ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.06.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය

ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී සංගමය,
අංක. 105/14,
අත්තිඩිය පාර,
රත්මලාන,

*පළමුවැනි පාර්ශ්වය.*

නඩු අංකය: A/51/2020.
*ගොනු අංකය*: IR/COM/04/E/2014/84

එරෙහිව

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
"ගාලු පාර"
රත්මලාන,

*දෙවැනි පාර්ශ්වය.*

අතර පවත්නා කාර්මික ආරාවුල

**ප්‍රදානය**

ගරු කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් කම්කරු අමාත්‍ය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් අංක IR/COM/E/2014/84 හා 2020 ඔක්තොබර් 07 දරන ලිපියෙන් මා පත්කර ඇත.

**ආරාවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝග ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුල.

1. ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී සංගමය,
අංක. 105/14,
අත්තිඩිය පාර,
රත්මලාන,

*එක් පාර්ශ්වයක් වශයෙන්ද.*

2. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
"ගාලු පාර"
රත්මලාන.

*අනෙක් පාර්ශ්වයද වේ.*

ඉහත සඳහන් පාර්ශ්ව අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වශයෙන් කම්කරු කොමසාරිස් ජෙනරාල් ඒ. විමලවීර මහතා විසින් IR/COM/E/2014/84 හා 2020 - පෙබරවාරි 22 දින දරන ලිපියේ සඳහන් කර ඇත්තේ "ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පවිත්‍රාගාර කාර්මික ශිල්පී අභ්‍යාසලාභී තනතුරු සඳහා බඳවාගත් මෙහි උපලේඛනයේ නම් සඳහන් සේවකයන් වසරක අභ්‍යාසලාභී කාලසීමාව අවසානයේ පවිත්‍රාගාර කාර්මික ශිල්පී තනතුරේ ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයක් කවරේද යන්න පිළිබඳව වේ".

**ආරාවුල සම්බන්ධයෙන් විසඳිය යුතු ගැටළු.**

1. ලේඛනයේ සඳහන් සේවකයන් අභ්‍යාසලාභීන් ලෙස බඳවාගෙන තිබේ ද?
2. ස්ථිර කිරීම් කාල සීමාවන් පත්වීම් ලිපියේ සඳහන් කර තිබේද?
3. ඒ අනුව ආයතනය කටයුතු කර තිබේද?
5. එසේ කර නොමැති නම් බලපෑ හේතු මොනවාද?

මෙම පරීක්ෂණය බේරුම්කරු එස්. කාරියවසම් මහතා ඉදිරියේ ආරම්භ කර ඇති අතර පළමු පාර්ශ්වය වෙනුවෙන් ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී සංගමයෙහි සභාපති දුමින්ද සමරනායක සහ හර්ෂණ චන්ද්‍රසේන යන මහත්වරු නීතීඥ ඒ. සුසන්ත එම්. ගුණසේකර මහතා පෙනී සිටින අතර දෙවන පාර්ශ්වය වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් මානව සම්පත් ජ්‍යෙෂ්ඨ නිලධාරී ශාන්ති බාලගේ මහත්මිය සමඟ කේ. ඩී. සී. ප්‍රියදර්ශනි මහත්මිය නීතීඥ අසේල ප්‍රිය සිරි මහතා සමඟ පෙනී සිටියහ නඩු විභාගය ආරම්භයේදී දෙවන පාර්ශ්වය වෙනුවෙන් රජයේ අධි නීතීඥ දිලිනි පෙරේරා මෙනවිය පෙනී සිට ඇත.

මෙම ආරාවුල 2020 ඔක්තෝබර් 07 බේරුම්කරුවෙකු ලෙස මා පත්කර ඇති අතර 2021.04.22 දින නඩු විභාගය ආරම්භ කර ඇති අතර 2021.04.22 ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී සංගමය සභාපති දුමින්ද සමරනායක මහතා ලේකම් වසන්ත අබේසිංහ මහතා යන අය නීතීඥ ඒ. සුසන්ත එම්. ගුණසේකර මහතා සමඟ පෙනී සිටි අතර ජාතික ජල සම්පාදන ජලපවහන මණ්ඩලය වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මානව සම්පත් අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිනි ශාන්ති බාලගේ මහත්මිය සමඟ නීතීඥ දිමුතු සූරසේන මහතා පෙනී සිටි අතර 2022.01.06 දින වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් කවින්දි හබරගමුව මහත්මිය පෙනී සිටින ලදි 2022.09.23 දින වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් නීති නිලධාරී රංග දහනායක මහතා සහ ජ්‍යෙෂ්ඨ මානව සම්පත් නිලධාරී චම්පා ප්‍රියදර්ශනී මහත්මිය සමඟ නීතීඥ තරිකා හේවගේ මෙන විය පෙනී සිටින ලදි.

ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් මංජුල ජයරත්න, දුමින්ද සමරනායක යන අයවලුන් සාක්ෂි ලබාදී ඇති අතර ඇමුණුම් 01-23 දක්වා ලේඛන ලකුණු කර ඇත.

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ මානව සම්පත් නිලධාරිණී කේ. ඩී. සී. ප්‍රියදර්ශනී මහත්මිය කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාර සමරවීර මුදලිගේ මොහාන් දීපලාල් මහතා ද සාක්ෂි ලබාදී ඇත. R01 - R06 දක්වා ලේඛන ලකුණු කර ඇත.

දෙපාර්ශ්ව වෙනුවෙන්ම ප්‍රකාශ සපයා ඇති අතර පිළිතුරු ප්‍රකාශ 2017.11.15 ට පෙර ඉදිරිපත් කරන මෙන් දෙපාර්ශ්වයටම දැනුම් දී ඇති අතර පළමු පාර්ශ්වය 2017.12.15 පිළිතුරු ප්‍රකාශ ඉදිරිපත් කර ඇති අතර දෙවන පාර්ශ්වය පිළිතුරු ප්‍රකාශ ඉදිරිපත් කර නැත.

1. මෙම ඉල්ලුම්කරුවන් අභ්‍යාසලාභීන් ලෙස බඳවාගෙන තිබේද? අදාල පත්වීම් ලිපි ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳව විරෝධතාවයන් දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර නොමැති බැවින් ඉල්ලුම්කරුවන් අභ්‍යාස ලාභීන් ලෙස බඳවාගත් බව තහවුරු වේ.

2. ඉදිරිපත් කර ඇති අභ්‍යාසලාභී පත්වීම් ලිපියේ 4 වන වගන්තිය අනුව වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක වුවහොත් සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් අනතුරුව ස්ථිර කිරීමට සලකා බලනු ලැබේ යැයි සඳහන් වේ මෙය ආයතනය විසින් කළ යුතු කාර්යයක් වන අතර එය කළ බවත් සාක්ෂි මගින් තහවුරු කර නැත. ඒ අනුව ආයතනය එම ක්‍රියා මාර්ගය පැහැර හැර ඇති බැව් පෙනේ.

3. ඒ අනුව කටයුතු කර තිබේද?
පත්වීම් ලිපියේ 4 වන වගන්තිය අනුව එවැනි ක්‍රියා මාර්ගයක් නොගත් බව පැහැදිලි වන අතර ආයතනයේ මානව සම්පත් නිලධාරිණී සාක්ෂි මගින් ප්‍රකාශ කර ඇත්තේ තනතුර ස්ථිර කිරිම සඳහා කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතු බවය.

සාක්ෂි සටහන් 152

ප්‍රශ්නය - මෙලෙස බඳවා ගන්නා අභ්‍යාසලාභීන්ට පසුව සිදුවන්නේ කුමක්ද?
උත්තරය - මේ අතරතුර මණ්ඩලයේ අනුමත සැලැස්ම තුළ පුරප්පාඩු පැවැතුන හොත් ස්ථිර සේවක මණ්ඩලයට එකතු කර ගන්නවා පුරප්පාඩු නැත්නම් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනවා.

මෙම සාක්ෂි අනුව 2005 - 2006 - 2007 සඳහා අනුමත පුරප්පාඩු 30 ක් වි ඇති අතර එයින් 8කම අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති බැව් ප්‍රකාශ කර ඇත.

සාක්ෂි සටහන් 154 පිටුව

උත්තරය -

2006 වර්ෂයේ 07 බඳවා ගත්තා. මට නිවැරදි කිරීමක් කරන්න ඕන. කළමණාකාර දෙපාර්තමේන්තුවේ නියෝග මත නොවේ. අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මතයි තව 7 දෙනෙකුට අනුමැතිය ලබාගෙන ඇත්තේය.

සාක්ෂිකාරියගේ සාක්ෂි සටහන් අනුව 2005 - 2006 - 2007 බඳවා ගැනීම් 30ක් ද ස්ථිර කිරීමේ 03 සහ අතිරේක 12 බවත් සාක්ෂි සටහන් වල සඳහන් වේ.

සාක්ෂිකාරියගේ සාක්ෂි සටහන් 156 පිටුව

ප්‍රශ්නය -

ඒ කියන්නේ මහත්මිය, 2004 සිට බඳවා ගත් අභ්‍යාසලාභීන් 2007 වන විට අපි සම්පූර්ණයෙන් ස්ථිර සේවකයින් ලෙස බඳවා ගෙන ඉවරයි. 2008 සිට මේ අතිරික්ත සංඛ්‍යාවක් ඉදිරියට එන්නේ........ මේ අතිරික්ත අයට මොකද කරන්න පුළුවන්?

එයට තියෙන මාර්ග මොනවාද?

උත්තරය -

අතිරික්තයක් තියෙන කොට කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරන්න පුළුවනි.

නමුත් එවැනි ක්‍රියාමාර්ගයක් ගත් බවක් සාක්ෂි මගින් තහවුරු නොවුන අතර කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද ලේඛනයේ R3 ලෙස ලකුණු කර ඇතත් එය ලිඛිත දේශන සමග ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම ලේඛන අධිකරණය ඉදිරියේ නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලැබී නැත. එමෙන්ම 2006 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත 08 දෙනෙකු ගත් බවත් සඳහන් කර ඇතත් 2008 වර්ෂයේ එවැනි ක්‍රියා මාර්ගයක් ගත් බවත් සඳහන් නොවේ.

සාක්ෂි සටහන් 207 -

කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරිගේ සාක්ෂි සටහන් අනුව

ප්‍රශ්නය -

ඔබ කිව්වා කාර්ය මණ්ඩලයේ තනතුරු 30ක් ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී තනතුරට බඳවා ගැනීමට 2007 වර්ෂයේ තම ආයතනය තනතුරු අනුමත කළාද?

උත්තරය -

ඔව්.

නමුත් ආයතනයේ මානව සම්පත් සාක්ෂි කාරියගේ සාක්ෂි සටහන්වල

ප්‍රශ්නය.

ඊළඟට මහත්මිය 2007 වර්ෂය

උත්තරය -

2007 වර්ෂයේ අර 16 ට අමතරව 14 කට අනුමැතිය ලැබුණා.

මෙම සාක්ෂි සටහන්වල පරස්පරතාවයක් පවතී.

මේ අනුව අභ්‍යාසලාභීන් ස්ථිර කිරීම පිළිබඳව ජාතික ජල සම්පාදන මණ්ඩලය හා ජලාපවහන මණ්ඩලය සැබෑ උත්සාහයක් ගෙන නැති බැව් පැහැදිලිය.

04. ස්ථිර නොකිරීමේ බාධක තිබේද?

වග උත්තරකාර ආයතනයේ සාක්ෂි අනුව පුරප්පාඩු සඳහා කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නැතිව කළ නොහැකි බැව් ප්‍රකාශ කළ ද 2006 වර්ෂයේ පත්වීම් 08ක් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව කළ බවක් තහවුරු වේ. එසේ නම් කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගත යුතුය යන තර්කය පිළිගත නොහැකි ය.

ඉහත සාක්ෂි සටහන් අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ජල පවිත්‍රාගාර අභ්‍යාසලාභී කාර්මික ශිල්පීන් ස්ථිර කිරීමේදී අසාධාරණයක් වී ඇත්ද යන්නට පිළිතුර ඔව් යන්නයි.

ලබාදිය යුතු සහන කවරේද යන්නට පිළිතුර පහත සඳහන් වේ.

පහත සඳහන් සේවකයන් ඔවුන්ට අදාළ දිනයේ සිට ස්ථිර සේවයේ පිහිටුවන ලෙසත්, අදාළ හිඟ වැටුප් ගෙවා අදාළ වැටුප් තලයේ පිහිටුවන ලෙසත් මෙයින් නියෝග කරමි.

ලේඛනය -

| | සේවකයාගේ නම | අභ්‍යාසලාභී තනතුරට බඳවාගත් දිනය | වසරක සේවා කාලය අවසානයේ ස්ථිර කළයුතු දිනය | ආයතනය ස්ථිර කළ දිනය | අදාළ හිඟ වැටුප (රුපියල්) |
|---|---|---|---|---|---|
| 01 | යූ. ජී. ටී. එම්. ජයරත්න | 2007.10.22 | 2008.10.21 | 2011.06.01 | 502,387.50 |
| 02 | එස්. ඒ. පී. කේ. කරුණාරත්න | 2007.10.23 | 2008.10.22 | 2011.06.01 | 501,747.51 |
| 03 | ඊ. ජී. ඒ. ප්‍රියමාන්න | 2008.06.02 | 2009.06.01 | 2011.06.01 | 383,990.40 |
| 04 | ඒ. එස්. කේ. අලහකෝන් | 2008.06.09 | 2009.06.08 | 2011.06.01 | 382,710.57 |
| 05 | ආර්. එම්. එන්. සිසිර කුමාර | 2008.06.16 | 2009.06.15 | 2011.06.01 | 378,230.64 |
| 06 | බී. සී. හෙට්ටිආරච්චි | 2008.09.22 | 2009.09.21 | 2011.06.01 | 326,391.90 |
| 07 | එස්. එච්. පී එච්. චන්ද්‍රසේන | 2008.09.22 | 2009.09.21 | 2011.06.01 | 326,391.90 |
| 08 | කේ. එස්. ඩී. සෙනවිරත්න | 2008.09.22 | 2009.09.21 | 2011.06.01 | 326,391.90 |
| 09 | ඒ. කේ. එම්. කේ. අත්තනගොඩ | 2008.09.22 | 2009.09.21 | 2011.06.01 | 326,391.90 |
| 10 | කේ. ඩී. ඩී. පී. කත්‍රිආරච්චි | 2008.09.24 | 2009.09.23 | 2011.06.01 | 326,391.90 |
| 11 | පී. ජී. එස්. ආසිරි බණ්ඩාර | 2008.09.24 | 2009.09.23 | 2011.06.01 | 326,391.90 |
| 12 | එච්. එස්. කල්හාර | 2008.10.01 | 2009.09.30 | 2011.06.01 | 320,631.99 |
| 13 | එච්. පී. එස්. රංගන | 2008.10.01 | 2009.09.30 | 2011.06.01 | 320,631.99 |
| 14 | පී. එම්. ඩී. කුමාර | 2008.10.01 | 2009.09.30 | 2011.06.01 | 320,631.99 |
| 15 | එම්. එම්. එස්. අයි. විජේරත්න | 2009.03.19 | 2010.03.18 | 2011.06.01 | 232,314.27 |
| 16 | යූ. කේ. ඩී. සාරංග | 2009.03.25 | 2010.03.24 | 2011.06.01 | 228,474.93 |
| 17 | ටී. එස්. මානවඩු | 2009.03.25 | 2010.03.24 | 2011.06.01 | 228,474.93 |
| 18 | එච්. ආර්. සී. ලසන්ත | 2009.03.26 | 2010.03.25 | 2011.06.01 | 227,834.34 |
| 19 | ජේ. ඒ. සී. එන්. රණසිංහ | 2009.05.04 | 2010.05.03 | 2011.06.01 | 209,914.92 |
| 20 | කේ. එම්. ටී. එස්. කුමාර | 2009.05.04 | 2010.05.03 | 2011.06.01 | 209,914.92 |
| 21 | එම්. එල්. එස්. සඳරුවන් | 2009.05.04 | 2010.05.03 | 2011.06.01 | 209,914.92 |
| 22 | එච්. ඒ. අයි. උද්දික | 2009.05.05 | 2010.05.04 | 2011.06.01 | 209,274.93 |
| 23 | කේ. එම්. මාලක සංජීව | 2009.06.22 | 2010.06.21 | 2011.06.01 | 182,395.50 |
| 24 | ආර්. එම්. ජේ. කේ. රත්නායක | 2009.06.22 | 2010.06.21 | 2011.06.01 | 182,395.50 |
| 25 | එන්. ඒ. ඩී. කේ. චන්ද්‍රසේන | 2009.06.22 | 2010.06.21 | 2011.06.01 | 182,395.50 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 26 | ඩබ්. ඒ. ඩී. ඒ. ඩී. යූ. වික්‍රමසිංහ | 2009.06.22 | 2010.06.21 | 2011.06.01 | 182,395.50 |
| 27 | වයි. එම්. ප්‍රදීප් බණ්ඩාර | 2009.06.23 | 2010.06.22 | 2011.06.01 | 181,755.51 |
| 28 | ඩී. එම්. එල්. පී. කේ. දිසානායක | 2009.06.23 | 2010.06.22 | 2011.06.01 | 181,755.51 |
| 29 | එල්. ඒ. ප්‍රියන්ත කුමාර | 2009.06.26 | 2010.06.25 | 2011.06.01 | 179,835.54 |
| 30 | එම්. ආර්. එස්. ඩී. බණ්ඩාර | 2009.08.31 | 2010.08.30 | 2011.06.01 | 144,636.39 |
| 31 | ඊ. එම්. සී. එස්. බී. ඒකනායක | 2009.08.31 | 2010.08.30 | 2011.06.01 | 144,636.39 |
| 32 | බී. එම්. ආර්. ටී. බී. බස්නායක | 2009.08.31 | 2010.08.30 | 2011.06.01 | 144,636.39 |
| 33 | යූ. ජී. එන්. එන්.  විජේරත්න | 2009.08.31 | 2010.08.30 | 2011.06.01 | 144,636.39 |
| 34 | ඩබ්. අරුණ ජයලත් | 2009.09.14 | 2010.09.13 | 2011.06.01 | 139,516.62 |
| 35 | පී. කසුන්ග පෙරේරා | 2009.09.14 | 2010.09.13 | 2011.06.01 | 139,516.62 |
| 36 | ඩබ්. එම්. සී. උදය කුමාර | 2009.09.14 | 2010.09.13 | 2011.06.01 | 139,516.62 |
| 37 | ඒ. ඩී. ඩබ්. එස්. විමලවීර | 2009.09.14 | 2010.09.13 | 2011.06.01 | 139,516.62 |
| 38 | ඩබ්. එම්. එස්. අයි. බී. විජේසුන්දර | 2009.09.14 | 2010.09.13 | 2011.06.01 | 139,516.62 |
| 39 | වී. පී. නිමල් රත්න | 2009.09.15 | 2010.09.14 | 2011.06.01 | 138,876.63 |
| 40 | ඒ. ඒ. ජී. ආර්. ජේ. රත්නායක | 2009.09.15 | 2010.09.14 | 2011.06.01 | 138,876.63 |
| 41 | එස්. එම්. එන්. කේ. බණ්ඩාර | 2009.09.16 | 2010.09.15 | 2011.06.01 | 138,236.64 |
| 42 | ජී. ඩී. එන්. පී. ගොඩගම්පල | 2009.09.18 | 2010.09.17 | 2011.06.01 | 136,956.66 |
| 43 | වයි. එම්. එම්. යාපා | 2009.09.22 | 2010.09.21 | 2011.06.01 | 134,396.70 |
| 44 | ජී. ඒ. ඒ. යූ. ගමආරච්චි | 2009.11.13 | 2010.11.12 | 2011.06.01 | 108.157.41 |
| 45 | එච්. පී. රාජකරුණා | 2009.11.13 | 2010.11.12 | 2011.06.01 | 108.157.41 |
| 46 | එම්. ඊ. ගනේවත්ත | 2009.11.13 | 2010.11.12 | 201 1.06.01 | 108,157.41 |
| 47 | ඩබ්. එස්. රාජපක්ෂ | 2009.11.13 | 2010.11.12 | 2011.06.01 | 108,157.41 |
| 48 | අයි. එම්. ටී. ඩී. ඉලංගකෝන් | 2009.11.13 | 2010.11.12 | 2011.06.01 | 108,157.41 |
| 49 | ජේ. ඒ. ඩී. ජී. ඩබ්. ජයසුන්දර | 2009.11.13 | 2010.11.12 | 2011.06.01 | 108,157.41 |
| 50 | ඊ. එම්. අයි. උදය ශාන්ත | 2009.11.13 | 2010.11.12 | 2011.06.01 | 108,157.41 |

අදාළ වැටුප් තලයේ නියමිත දිනයන්හි පිහිටුවා ගණනය කළ හිඟ වැටුප් මුදල වූ රුපියල් එක්කෝටි අටලක්ෂ දහ අටදහස් නවසිය තිස්හතරයි ශත පනහක් ( 10,818,934.50 ) සහකාර කම්කරු කොමසාරිස් දකුණු කොළඹ ඉදිරියේ මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට මසක් ඇතුලත ගෙවීම් කරන ලෙස මෙයින් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීන්දුවක් බව සනාථ කරමි.

ඒ. ඒ. වීරසූරිය,
බේරුම්කරු,

2023 ජුනි මස 21,
කොළඹ කාර්මික අධිකරණයෙ දී.

EOG 08 - 0080

*මගේ අංකය*: IR/COM/03/2016/157.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2315/68 දරන හා 2023.01.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි පිහිටි ජාතික සේවක සංගමය ( සේවකයින් 20 දෙනෙක් වෙනුවෙන්) සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 04, බම්බලපිටිය, මෙල්බන් ඇවනියු, අංක 27හි පිහිටි සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 64/2020 දරන හා 2022.11.10 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.
එහෙයින් අංක A 64/2020 දරන බේරුම්කාර ප්‍රදනය ක්‍රියාත්මක වීම 2024.01.21 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය
"අ" ආකෘති පත්‍රය

(3 වන නියෝගය),

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**
**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය-සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම,
අංක 27,
මෙල්බන් ඇවනියු,
බම්බලපිටිය,
කොළඹ 04.

දිනය-2023.02.24

2023.01.21 දිනැති හා අංක 2315/68 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද සී/ස ලංකා සීනි (පුද්.) සමාගම සහ ජාතික සේවක සංගමය බැඳී සිටින්නා වූද 2022.11.10 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රධාන මෙහෙයුම් නිලධාරි,
ලංකා සීනි (පුද්.) සමාගම - පැල්වත්ත ඒකකය.

පිටපත-

ජාතික සේවක සංගමය, අංක. 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

එම්.කේ. ලීලාරත්න, අංක. 80, කටුගහගල්ගේ ජනපදය, බුත්තල.

ජී.නිහාල් ශාන්ත, 15 කණුව, හොරබොක්ක, ඌව පැල්වත්ත.

ආර්.එම්.ඥානරත්න, ඇලකණ්ඩිය, කුකුරම්පොළ, ඌව පැල්වත්ත.

ආර්.එම්.කරුණාරත්න, කුමාරපොත, කුකුරම්පොළ, ඌව පැල්වත්ත.

ආර්.එම්. පොඩිමැණිකේ, යාලබෝව පාලම අසල, යාලබෝව,වැල්ලවාය.

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවකයා හෝ සේවායෝජකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකටම, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20 (1) වන වගන්තිය බලන්න.

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක් සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වගද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 08 - 0081

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.